අංක 3/2002

# තෝරා දළු නෙලනය



ශ්‍රී ලංකා
තේ පර්යේෂණායතනය

Reference Only




# හැදින්වීම

ශ්‍රී ලංකා තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන් ප්‍රබල දායකත්වයක් සපයන අතර, ඔවුන්ගේ නිෂ්පාදන ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතන විසින් මෑතකදි තේ දළු නෙලන උපකරණයක් නිර්මාණය කර ඔවුනට හිමිකර දී ඇත.

විශේෂයෙන් ම කුඩා තේ වතු හිමියන්ට ප්‍රබල ව බලපාන්නා වූ ගැටළුවක් වනුයේ තේ දළු නෙලීමට පුහුණු ශ්‍රමය හිඟයත් ඒ සඳහා විශාල මුදලක් වැයවීමත් ය. මෙයට කදිම විසඳුමක් ලෙස මෙම තෝරා තේ දළු නෙලනය හඳුන්වාදිය හැක.

2001 වසරේ ස්විස්ටර්ලන්තයේ ජිනිවා නුවර ජාත්‍යයන්තර නව නිපැයුම් සඳහා පැවති ප්‍රදර්ශණයේදී රටවල් 44 ක කෘෂිකාර්මික නව නිපැයුම් 1000 කට අධික සංඛ්‍යාවක් පරදවා කෘෂිකාර්මික අංශයේ නව නිපැයුම් සඳහා පිරිනමන ලද රන් පදක්කම දිනා ගැනීමට ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය ඉදිරිපත් කල මෙම තෝරා තේ දළු නෙලන උපකරණය සමත් විය.




තේ දළු නෙලන උපකරණය වෙනුවෙන් එහි නිර්මාතෘ ආචාර්ය එම්.ඒ විජේරත්න මයා දිනාගත් රන් පදක්කම සහ සහතිකය

## තෝරා තේ දළු නෙලන උපකරණය

තේ පර්යේෂණායතනය මගින් නිෂ්පාදිත අතින් ක්‍රියා කරවන තෝරා තේ දළු නෙලන උපකරණය සැහැල්ලු ය. හුරුබුහුටි ය. මෙම උපකරණය ප්‍රධාන ලෙස තියුණු මුවහත් වානේ තල දෙකක් සහ ප්ලාස්ක් පෙට්ටියකින් සමන්විතය. මෙහි එක් වානේ තලයක් සවිකල හැඬලය පහසුවෙන් එහා මෙහා කල හැකි ය.



හැඬලය එක් කෙලවරකින් මුරච්චි ඇණයක් මගින් ප්ලාස්ටික් පෙට්ටියට සම්බන්ධ වී ඇත. මෙම උපකරණයේ හැඬලයට සම්බන්ධ වානේ තලය ප්ලාස්ටික් පෙට්ටියට සම්බන්ධ මුවහත් වානේ තලයට එරෙහිව චලනය මගින් තේ දළු නෙලීම සිදු වේ. මෙලෙස කැපෙන්නා වූ දළු පෙට්ටිය තුලට එකතු වීම සිදු වේ. මෙම උපකරණයේ කැපෙන වානේ තල දෙක පෙට්ටියේ පතුලට සෙ.මී 2.5 ක් පමණ ඉහලින් සවි ඇති නිසා නොමේරූ දළු බේරා සුදුසු දළු පමනක් කඩා ගැනීමට හැකිවීම මෙහි විශේෂ ලක්ෂණයක් වේ.

මෙහි පෙට්ටියේ පතුල සිදුරු සහිත ව නිර්මාණය කර ඇති නිසා වැසි සහිත අවස්ථා වලදී දළු සමඟ ඇති වතුර ඉවත් වීමට පහසු වේ.

# කුඩා තේ වතු හිමියන්ට මෙහි වැදගත්කම


ශ්‍රී ලංකා තේ නිෂ්පාදනයේ ප්‍රධානතම කොටස්කරුවා වන කුඩා තේ වතු හිමියන්ගේ නිෂ්පාදන වියදමින් 60% ක ප්‍රමාණයක් වැය වනුයේ දළු නෙළීමේ කාර්යය වෙනුවෙනි. අවශ්‍ය මිනිස් ශ්‍රමය හිඟවීම නිසා කුඩා තේ වතු හිමියන් සතු වගාවන් හි දළු නෙළීම බරපතල ගැටළුවක් වී ඇත. නිසි කලට දළු නෙළීමට නොහැකි වීමෙන් අස්වැන්න අඩු වී ආර්ථික අවාසි සිදු වේ. මේරූ දළු කර්මාන්තශාලා වලින් ප්‍රතික්ෂේප කරන නිසා ඔවුනට විශාල පාඩුවක් දැරීමට ද සිදුවේ.

ඉහත ගැටළු වලට හොඳ විසඳුම් මෙම තෝරා තේ දළු නෙළන උපකරණයෙන් ලබා දෙයි. මෙය මිලදී ගැනීම සඳහා මූලික මුදලක් වැය වූවත් නඩත්තුව හා භාවිතයට මුදල් වැය නොවන නිසා ආර්ථිකමය ලෙස වාසි සහගත ය. මෙම උපකරණය භාවිතයෙන් තම පවුලේ සාමාජිකයන් යොදා ගෙන පහසුවෙන් තේ දළු නෙලා ගත හැකි ය. මෙම උපකරණය භාවිතා කිරීමේ දී දෑතින් දළු නෙලීමේ දී මෙන් ඇඟිලි තුවාල වීමක් හෝ අපිරිසිදු වීමක් සිදුනොවන බැවින් තරුණ තරුණියන්ට ද උනන්දුවෙන් දළු නෙළීමට දායක විය හැකි ය.

තේ දළු නෙළන උපකරණය භාවිතා කිරීමෙන් දිනකට කිලෝ ග්‍රෑම් 40-50 ක පමණ දළු ප්‍රමාණයක් නෙලාගත හැකි අතර එය සාමාන්‍යයෙන් දිනකදී අතින් නෙලන දළු ප්‍රමාණය මෙන් දෙගුණයක් පමණ වේ. එ නිසා දළු නෙළීමේ වියදම 30%-50% ක පමණ ප්‍රමාණයකින් අඩු කිරීමේ හැකියාව මෙම උපකරණයට ඇත.

# උපකරණය භාවිතා කිරීම

පහත ජායාරූපයේ පෙනෙන ආකාරයට හැඩලයේ ඉහල කෙලවරට මාපට ඇඟිල්ලෙන් සහ දබරැඟිල්ලෙන් තරමක බලයක් යෙදෙන ආකාරයට මෙම උපකරණය අල්ලා ගන්න. වඩාත් හොඳින් දළු කැපෙන්නේ වානේ තලයේ ඉහල 2/3 පමණ කොටසින් බව මතක තබා ගන්න.



මෙම උපකරණයේ විශේෂත්වය වන්නේ එක් වලන වාරයකදී දළු 3-4 ක් පමණ එකවර නෙලා ගැනීමට ඇති හැකියාව ය.

තෝරා දළු නෙලනය භාවිතයේදී පෙට්ටියේ පතුල දළු තලයට සමාන්තරව පවත්වා ගැනීම, හොඳින් දළු තෝරා නෙලා ගැනීමට මෙන් ම අනවශ්‍ය ලෙස දළු කැපීයාම වලක්වා ගැනීමට ද වැදගත් වේ.

මෙම උපකරණය භාවිතාකර දළු නෙලීමෙන් අනතුරුව කුඩා වංගි දළු ඇත්නම් ඒවා අතින් කඩා ඉවත් කල යුතුය.

## තෝරා තේ දළු නෙලන උපකරණය භාවිතයේ වාසි

- ◆ මෙය විශාල වතු මෙන් ම කුඩා තේ වතු සඳහා ද සුදුසුය.
- ◆ සරල හා සැහැල්ලු උපකරණයක් නිසා පරිහරණය ඉතා පහසුය. භාවිතයට විශේෂ දැනුමක් අවශ්‍ය නැත.
- ◆ ක්‍රියා කරවීමට ඉන්ධන අවශ්‍ය නොවන නිසා භාවිතයේදී අමතර වියදමක් දැරීමට සිදු නොවේ.
- ◆ අවම ශ්‍රමයකින් වැඩි දළු ප්‍රමාණයක් නෙලා ගත හැකිය.
- ◆ කම්කරුවන්ට ඉහල දෛනික ආදායමක් උපයා ගැනීමට හැකියාව ලැබේ.
- ◆ කුඩා දළු (අරම්බු) කැපීමක් සිදු නොවන බැවින් අස්වැන්නේ අඩුවීමක් සිදු නොවේ.
- ◆ දළු තැලීමක්, පොඩිවීමක්, සිදු නොවන නිසා තත්වයෙන් උසස් දළු කර්මාන්තශාලාවට යැවිය හැක.

### <u>භාවිතයේ දී සැලකිය යුතු වෙනත් කරුණු</u>

✖ කොල අතර පරතරය වැඩි ක්ලෝන විශේෂ ඇති ක්ෂේත්‍ර සහ වංගි දළු අඩු ක්ෂේත්‍රවල මෙම උපකරණය යොදා දළු නෙලීම වඩා ප්‍රතිඵල දායකය.

✖ තේ වගාවට පොහොර යොදා දින 7-14 පමණ කාලයකදී අප නිර්දේශ කරන පරිදි සින්ක් සල්ෆේට් යෙදීමෙන් වංගි අංකුර සෑදීම අවම කරගත හැක.

- ✘ ක්ෂේත්‍රයේදී තල දෙක හොඳින් ස්පර්ශ වන සේ ක්‍රියා කරන්නේ දැ යි සැලකිලිමත් විය යුතුය.
- ✘ භාවිතයට පෙර ඇණ මුරච්චි හොඳින් සවි වී ඇති දැ යි පරීක්ෂා කල යුතුය.
- ✘ භාවිතා නොකරන විට මෙය සෙවන ස්ථානයක තැබිය යුතුය.

## තෝරා තේ දළු නෙලන උපකරණය භාවිතා නොකලයුතු විශේෂ අවස්ථා

**තේ වගාව දළු නෙලීමේ අවධියට ගෙන ඒමෙන් පසුව..**

- **පළමු වසර තුලදී**
- **වියළි මාස වලදී**
- **මට්ටම් කැපීමෙන් පසු පළමු මාස 6 තුලදී ද ,**

**දළු නෙලන උපකරණය භාවිතා නොකල යුතු ය.**

## තෝරා දළු නෙලන උපකරණය භාවිතයට සුදුසු අවධිය

කප්පාදු චක්‍රයේ දෙවන වසරේ සිට දළු නෙලන උපකරණය යොදා දළු නෙලීම යෝග්‍ය වේ. දළු නෙලන උපකරණයෙන් දළු නෙලන අතර වාරයේ මසකට එක් අවස්ථාවක් අතින් දළු නෙලීම ගසේ පැවැත්ම මෙන් ම අස්වැන්න වැඩි වීමට ද හේතු වේ. මෙම උපකරණය භාවිතයේ දී සාමාන්‍යයෙන් අතින් දළු නෙලන දළු රවුමට වඩා දින 2-3 කින් දළු රවුම දීර්ඝ කරගැනීම වඩා යෝග්‍ය වේ.

මෙම උපකරණය භාවිතයේ දී දළු දැමීමට කූඩයක් භාවිතා කල යුතු අතර කූඩය නිරතුරු ව දළු වලින් පිරෙන බැවින් නිතර ම දළු ඉවත් කිරීමට අමතර බැගයක් ලග තබා ගැනීම වැදගත් වේ. කප්පාදු චක්‍රයේ අවසාන කාලයේ දී තේ පඳුරු උසට වැවී ඇති විට මෙම උපකරණය භාවිතා කිරීම අපහසුය.

මෙම උපකරණය භාවිතා කරන මුල් කාලයේ කොල සහ දළු කැපීයාම සිදුවිය හැක. උපකරණය වාර කීපයක් භාවිතා කිරීමෙන් පසුව තේ පඳුරේ දළු මට්ටම පාලනය වීමෙන් කැපෙන දළු සහ කොල ප්‍රමාණය අවම වේ.

වෙළඳපොලේ දළු නෙලනයක මිල රු. 675/=

තොග වශයෙන් ලබා ගැනීමට විමසන්න;

**පී.පී.පී. ජිනදාස සමාගම, නො. 405, තාවල පාර, තාවල**

වැඩි විස්තර සඳහා විමසන්න;

උපදේශක නිලධාරි,
උපදෙස් හා ව්‍යාප්ති අංශය,
තේ පර්යේෂණායතනය,
තලවාකැලේ
051-24189

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
ශෂ්‍යවිද්‍යා අංශය
තේ පර්යේෂණායතනය,
රත්නපුර
045-28928

රත්නපුර 045-28628, 045 28748
මහනුවර-08-218509
පස්සර 055-22426
කොට්ටව (ගාල්ල)-09-86096,
සහ දෙනියාය- 041-73519
ප්‍රාදේශීය මධ්‍යස්ථාණ වලින්

සම්පාදනය
ධර්මප්‍රිය සමත්සිරි
ජානක කුලතුංග

තාක්ෂණික තොරතුරු
ආචාර්ය එම්.ඒ.විජේරත්න

ප්‍රකාශණය
ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය
තලවාකැලේ.